ආයතනයේ නම: කර්මාන්ත අමාත්‍යාංශය

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

**நிறுவனத்தின் பெயர்: கைத்தொழில் அமைச்சு**

**பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.**

**Name of the Institution: Ministry of Industries**

**Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee On Public Accounts in terms of Standing Order No. 119(4)**

ගරු අමාත්‍යතුමා
கௌரவ அமைச்சர்
Hon. Minister
011-2435248
Fax : 011-2390885

ලේකම්
செயலாளர்
Secretary
011-2436123
011-2436124
Fax : 011-2449402

අමාත්‍යාංශය
அமைச்சு
Ministry
011-2392149
011-2392150
Fax : 011-2390941

විද්‍යුත් තැපැල
மின்னஞ்சல்
E-mail
secretarymid@gmail.com

# කර්මාන්ත අමාත්‍යාංශය
# கைத்தொழில் அமைச்சு
# MINISTRY OF INDUSTRIES

තැ. පෙ. 570, 73/1, ගාලු පාර, කොළඹ 03, ශ්‍රී ලංකාව த. பெ. இல. 570, 73 / 1, காலி வீதி, கொழும்பு 03, இலங்கை
P. O. Box 570, 73/1, Galle Road, Colombo 03, Sri Lanka

මගේ අංකය / எனது இல. / My No. MIC/FIN/02/05/06

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2023.04. 24

**රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව මගින් ස්ථාවර නියෝග 119(4) අනුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ වාර්තාව සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියා මාර්ග සහ නිරීක්ෂණ ඉදිරිපත් කිරීම**

පාර්ලිමේන්තු සැසි අංකය:- අංක 183

ආයතනයේ නම :- කර්මාන්ත අමාත්‍යාංශය

| 2020 වර්ෂයට අදාලව රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව මගින් හඳුනාගත් දුර්වලතා | එම දුර්වලතා මග හරවා ගැනීමට ගන්නා ලද ක්‍රියා මාර්ග / වර්තමාන තත්වය |
|---|---|
| හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත. | හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාමට කටයුතු කර ඇත. |
| වාහනයක් ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබිණි. | වාහන නියමිත පරිදි අපහරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත් අතර වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය එම වාහන ඉල්ලා සිටියද මාස කීපයක් ගතවන තෙක් වාහන රැගෙන නොයන ලදී.එබැවින් අපහරණය ප්‍රමාද විය. එම අමාත්‍යාංශය විසින් වාහන ලබා නොගත් බැවින් නැවත අපහරණ ක්‍රියාවලිය ආරම්භ කර 2023.03.28 දින වාහන අපහරණය කරන ලදී. එහිදී KW-8777 ලැන්ඩ් රෝවර් ඩිස්කවරි රථය රු.12,368,000.00ක මුදලකට හා KY-3709 ලැන්ඩ් රෝවර් ඩිස්කවරි රථය රු.13,989,989.00ක මුදලකට විකුණුම් කර ඇත. |
| 2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ජේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවක් කර නොතිබුණි. | පැවති ඉන්ධන අර්බුධය හා QR කෝටා ක්‍රමය මත වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රායෝගික ගැටලු ඇතිවිය. අමාත්‍යාංශ අතිරේක ලේකම් (පාලන) ගේ MIC/TR/02/04/02 අංක හා 2023.02.16 දිනැති ලිපි මගින් අමාත්‍යාංශය සතු වාහනවල ඉන්ධන පරීක්ෂාව සිදු කර වාර්තා ලබා දෙන ලෙස අදාල නිලධාරීන් දැනුවත් කර ඇති අතර මේ වන විට එම කටයුතු සිදු වෙමින් පවතී. |

| | |
|---|---|
| වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතීම | සේවය හැර ගිය ඩී.එම්.ජී.පී.එම්.ශ්‍යාමලී මියගෙන් අයවිය යුතු රු.78,750/- හා වැඩ තහනමකට ලක්වූ ඊ. කේ.ඩී. ප්‍රනාන්දු මහතා ගෙන් අයවිය යුතු රු.100,208/-ක ආපදා ණය මුදලේ ශේෂයන් මෙයට අයත්වේ. එම ණය මුදල් අදාල නිලධාරීන්ගෙන් අයකර ගැනීමට නෛතික ක්‍රියාමාර්ග මගින් කටයුතු ආරම්භ කර ඇති අතර එහි වර්තමාන තත්වය පහත පරිදි වේ.<br><br>**<u>1. ඩී.එම්.ජී.පී.එම්.ශ්‍යාමලී මිය</u>**<br>නීතිපති දෙපාර්තමේන්තුව විසින් මේ වනවිට ණය අයකර ගැනීමට අදාල නීතිමය කටයුතු අරඹා ඇත.<br>**<u>2. ඊ. කේ.ඩී. ප්‍රනාන්දු මහතා</u>**<br>මෙම නිලධාරියා මිය ගොස් ඇති අතර උරුමකරුවන්ගෙන් මුදල අයකර ගැනීමට ලේකම් විසින් අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව ඊ.කේ.ඩී.ප්‍රනාන්දු මහතාගේ උරුමකරුවන්ගේ තොරතුරු රැස් කර අදාල නීති ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය. |
| සමාලෝචිත වර්ෂය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කලයුතු කාර්යසාධන වාර්තා නියමිත දිනට ඉදිරිපත් කර නොතිබීම | මෙම වාර්තාව 2021.05.30 දින පාර්ලිමේන්තුව වෙත යොමු කිරීමට නියමිත වුවද එය 2021.09.28 දින දෘඩ පිටපත් 270 ක් හා මෘදු පිටපත් 02 කින් යුතුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.<br><br>එවකට රටේ පැවති කොරෝනා වසංගත ව්‍යාප්තිය හමුවේ අමාත්‍යාංශයේ විවිධ අංශ වල නිලධාරීන්ද කොවිඩ් රෝගයට ගොදුරු වීම නිසා බොහෝ නිලධාරීන් විටින් විට නිරෝධායනයට යොමු කිරීමට සිදු විය. තවද, වරින් වර සමහර අංශ තාවකාලිකව වසා දැමීමටද සිදුවිය. එසේම කාර්යාල කටයුතු පවත්වාගෙන යන දින ගණන සීමා වීමද සිදුවිය.<br><br>මේ තත්වයන් හේතු කොට ගෙන නියමිත දින වකවානු වලට තොරතුරු ලබා ගැනීමට ද අපහසු විය.<br><br>තවද, මෙම වාර්තාව මුද්‍රණය කර ගැනීමේදී ද විවිධ දුෂ්කරතා වලට මුහුණ පෑමට සිදුවිය. දීර්ඝ කාලයක් මුද්‍රණාල වසා තැබීමෙන් හා එම ආයතන වල සේවකයන් කොවිඩ් තත්වයන්ට ගොදුරු වීම හේතුවෙන් මුද්‍රණ කටයුතු වලදීද යම් ප්‍රමාදයක් සිදුවිය.<br><br>ඉහත කරුණු හේතුවෙන් අදාල වාර්තාව නියමිත කාලරාමුව තුලදී නිම කිරීමට නොහැකි වූ අතර නියමිත දිනට පෙර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමටත් නොහැකි විය. |

| | |
|---|---|
| අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවා ගෙන තිබුණි. | අමාත්‍යාංශයට අනුමත සංවර්ධන නිලධාරින් සංඛ්‍යාව 121කි. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ DMS/CM 27 හා 2020/09/04 දිනැති ලිපිය මගින් අමාත්‍යාංශය සඳහා සංවර්ධන නිලධාරීන් 100 දෙනෙකු අනුමත කර ඇති අතර DMS/CM 27 හා 2022/10/18 දිනැති ලිපිය මගින් කර්මාන්ත සංවර්ධන නිලධාරී 21 දෙනෙකු සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කර ඇත. 2020 උපාධිධාරි සංවර්ධන නිලධාරින් රැකියා ගත කිරීමේ වැඩසටහන යටතේ මෙම අමාත්‍යාංශය වෙත අනුයුක්ත කළ නිලධාරීන් 67 දෙනෙකු අමාත්‍යාංශයයේ සේවය කරන අතර මේ වන විට (2023.03.31) සංවර්ධන නිලධාරින් 188 ක් සේවය කරයි.<br>ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය 2019 වර්ෂයේ සිට මෙම අමාත්‍යාංශයේ විෂය පථය යටතට පත් කිරීම නිසා අමාත්‍යාංශයේ සංවර්ධන නිලධාරි සංඛ්‍යාව අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවන ලදි. එසේම, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියට අනුබද්ධව, සෑම ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකටම එක් සංවර්ධන නිලධාරියෙකු බැගින් නිලධාරීන් 358ක් අනුමත කර ගත යුතුය. මේ වනවිට අංක DMS/CM/27 හා 2020/09/04 දිනැති ලිපිය මගින් නිලධාරීන් 275ක් අමාත්‍යාංශයට අනුමත කර ඇත. දැනට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය යටතේ සංවර්ධන නිලධාරින් 300 දෙනෙකු සේවය කරනු ලැබේ.<br><br>ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය සහ අමාත්‍යාංශය සඳහා අනුමත පිරිස ඉක්මවන සංවර්ධන නිලධාරි තනතුරු අනුමත කර ගැනීම සඳහා ගොනු අංක MIC/ADM/03/Cadre හා 2023.02.17 දිනැති ලිපිය මගින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. |
| සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි. | මේ වන විට කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගත වී ඇත. |

**වෛද්‍ය රමේෂ් පතිරණ (පා.ම.)**
**කර්මාන්ත අමාත්‍ය**